# ආගමික වේලාව

මෙ කල ඇතැම් ගෙවල්වල බුදුන් වැඳීමට ස්ථානයක් කුඩා මන්දිරයක් ද හදා ගෙන ඇත. එය ඉතා හොඳයි. ඇතැම් අය උදේ සවස බුදුන් වඳිනවා, මල්-පහන් ආහාර-පාන පූජා කරනවා. සුන්දර ප්‍රතිපදාවෙකි.

එසේ ම හැම ගෙදරක ම ආගමික වේලාවක් සම්මත කර ගත යුතු ය. මේ කටයුත්තට දෙමාපියන් සිටිය යුතු බැවින් විශේෂයෙන් පියාණන්ට පහසු වේලාවක් වීම හොඳයි. මේ කටයුත්තට ලොකු ළමයින් මෙන් ම කුඩා ළමයිනුත් සහභාගී කරවා ගත යුතු බැවින් රෑ නො විය යුතුය.

දෙමාපියන් ගේ ආදර්ශය දරුවනට ලැබිය යුතුම හෙයින් මවුපිය දෙදෙනාම සහභාගී විය යුතුම යි. නො වැලැක්විය හැකි කටයුත්තක් යෙදුණත් එක් කෙනෙකු හෝ සහභාගී විය යුතු ය. යම් විදියෙකින් ගෙදරට අමුත්තකු දෙදෙනකු පැමිණියොත් හදිස්සියක් නො වේ නම් ඒ අයත් ආගමික වේලාවට සහභාගී කරවා ගත යුතුය. එසේ කිරීමෙන් යහපත් දෙකක් සිදු වෙනවා.

1. එසේ සහභාගී වූ අය සිය නිවසෙහිත් ආගමික වේලාවක් ආරම්භ කිරීම.
2. නැවැත මේ විලාවට නො පැමිණීම.

නියමිත වේලාවට ගෙදර සියලු දෙනාම බුදුන් වඳින තැනට හෝ සුදුසු තැනකට හෝ රැස්වී පහත සඳහන් කරුණු ටික සම්පූර්ණ කළයුතු වේ.

1. පන්සිල් සමාදන් වීම.
2. බුදුන් වැඳීම, මල් පහන් පිදීම.
3. කරණීයමෙත්ත සූත්‍රය වත් එකට සජ්ඣායනා කිරීම.
4. ළමයිනටත් ගැලපෙන පරිදි සුළු වෙලාවක් භාවනා කිරීම.
5. බණ පොතකින් පිටු දෙකක් වත් කාටත් ඇසෙන සේ කියවීම.
6. දරුවන්ගෙ කටයුතු සොයා බලා අවවාද කිරීම.
7. දෙවියනට පින් දීම. (ආකාසට්ඨා ච....)
8. දරුවන් දෙමාපියන්ට වැඳ කටයුතු අවසන් කිරීම.

කුඩා දරුවන් සහභාගී වන නිසා භාවනාව මෙසේ යොදා ගැනීම මැනවැයි.

"මම සුවපත් වෙම්වා, නිදුක් වෙම්වා, නීරෝගී වෙම්වා, මා මෙන් සියලු සත්ත්වයො ද සුවපත් වෙත්වා, නිදුක් වෙත්වා, නීරෝග වෙත්වා'යි කාටත්

ඇසෙන සේ පස් වාරයක් ගීත් හඬින් කියා එය ම නිහඬ ව පස් වාරයක් සිතීම.
බණ පොතෙකින් දවසකට පිටු දෙකක් කිය වූ විට මාසයකට පිටු හැටක කරුණු ඉගෙන ගනී. අවුරුද්කට පිටු 728 ක කරුණු ඉගෙන ගනී.

පුරාණ කාලයෙහි කටයුතු බහුල රජවරු ද මේ නයින් බොහෝ බණ ඉගෙන ගත්තා. සැදැහැවක් ජනතාව ද එසේ ම ඉගෙන ගත්තා. සමහර රජවරු අභිධර්මයෙන් ද බණ කියා ඇත.

මඩිහේ පඤ්ඤාසීහ ස්ථවිර